# සාහිත්‍ය මූලාශ්‍රයවල දැක්වෙන ඓතිහාසික තොරතුරු තහවුරු කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල උපයෝගිතාව පිළිබඳ විමර්ශනයක්; යාපහුව පුරාවිද්‍යා ස්මාරක ස්ථානය ඇසුරින්

කැලේගම ජිනරතන හිමි[1], ගාල්ලේ ධම්මින්ද හිමි[2], රිදීගම වනරතන හිමි[3],
පාහියංගල සුමංගල හිමි[4]

## හැඳින්වීම

සාහිත්‍ය මූලාශ්‍රයවල මෙරට ඓතිහාසික යුගයේ උදාව සිදු වූයේ ක්‍රි.පූ. තෙවන සියවසේ පටන් බැව් දැක්වී ඇතත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මතින් එම යුගයේ උදාව එයට සියවස් දෙකකට මත්තෙන් එනම් ක්‍රි.පූ. පස් වන සියවස තරම් ඈතට විහිදෙන බැව් තහවුරු වී තිබේ. පොදුවේ ක්‍රි.පූ. යුගයේ අවසන් සියවස් කිහිපයේ දී මෙරට ඓතිහාසික යුගයට එළඹ ඇති බැව් පසක්කොටගත හැකිය. මෙම සමයෙහි පටන් මෙරට ඇති වූ ශීඝ්‍ර සංස්කෘතික හා භෞතික සංවර්ධනයත් සමග ජනගහනය රට පුරා ව්‍යාප්ත වීමක් ද සිදුව තිබේ. ඒ බැව් මෙරට බොහෝ ප්‍රදේශයන්හි ව්‍යාප්තව ඇති බ්‍රාහ්මී ශිලාලේඛනවලින් ප්‍රකට වෙයි.මෙලෙස කලින් කලට ජනතාව රටපුරා ව්‍යාප්ත වූවා සේම විවිධ සිද්ධිදාමයන් පදනම්කොටගෙන යුගයෙන් යුගය මෙරට රාජධානීන් හා පාලන මධ්‍යස්ථානයන් ද විවිධ ප්‍රදේශයන්හි පැවති ආරක්ෂිත ස්ථානයන් කරා සංක්‍රමණය කොට ඇති බැව් ද ඉතිහාසගත තතු අනුසාරයෙන් පැහැදිලි වෙයි. මෙම සමයන්හි දී ආගමික, දේශපාලනික, ආර්ථික හා සාමාජීය වශයෙන් මෙන් ම වෙනත් සෙසු අවශ්‍යතාවන් පූරණය කරගනුවස් රටේ විවිධ ප්‍රදේශයන්හි නානාවිධ ඉදිකිරීම් රජවරුන්, අමාත්‍යවරුන්, වෙනත් ප්‍රභූන් විසින් මෙන් ම සාමාන්‍ය මහ ජනතාවගේ මැදිහත්වීම් මගින් ද සිදුව ඇති බවද ඉතිහාසගත තතු අනුසාරයෙන් පැහැදිලි වෙයි. අතීතයේ දී මෙලෙස විවිධ අවශ්‍යතා වෙනුවෙන් ඉදිකරන ලද ස්ථාන වර්තමානයේ දී ඓතිහාසික ස්ථාන වශයෙන් හඳුන්වනු ලැබේ. ඓතිහාසික වශයෙන් වැදගත්කම් සහිත සාහිත්‍ය මූලාශ්‍රයයන්හි මින් බොහෝමයක් ස්ථාන පිළිබඳව තතු දැක්වී තිබෙන බව ද පැහැදිලි කරුණකි. එම ඓතිහාසික තොරතුරු තහවුරු කරගත හැකි වටිනාම මූලාශ්‍රය වශයෙන් හැඳිනගත හැකිවන්නේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් ය. එම නිසා මෙම අධ්‍යයනයේ දී ඓතිහාසික ස්ථාන සම්බන්ධයෙන් සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන තොරතුරු තහවුරු කරගැනීම සඳහා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන්හි උපයෝගීතාව පිළිබඳ විමසීමක් සිදුකෙරේ. ඒ සඳහා යාපහුව ස්මාරක ස්ථානය පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයයන්හි සඳහන් තතු එහි සිදුකරන ලද

[1] ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර
[2] තාවකාලික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර
[3] තාවකාලික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර
[4] ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර

පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම් අනුසාරයෙන් තහවුරු වී ඇති ආකාරය නිදර්ශනයක් වශයෙන් භාවිතයට ගනු ලැබේ.

### අරමුණ

මෙරට බොහෝමයක් ඓතිහාසික වැදගත්කමක් සහිත සාහිත්‍ය මූලාශ්‍රයයන්හි ඓතිහාසික ස්ථාන පිළිබඳව කරුණු සඳහන්ව ඇත්තේ වුව ද එම කරුණු ඒ ආකාරයෙන් ම පිළිගත නොහැකි බවට උගතුන් අතර වාද පවතී. ඒ ඉන් බොහෝමයක් මූලාශ්‍රයයන්හි සමකාලීන වශයෙන් සිදු වූ සිද්ධිදාමයන්ට අමතරව එම මූලාශ්‍රය ලියැවුණු සමයට බොහෝමයක් එපිට සිදු වූ සිදුවීම් පිළිබඳ පවා අන්තර්ගතවන බැවිනි. එසේ වුව ද එම මූලාශ්‍රයයන්හි දැක්වෙන පූර්ව සමයන්ට අයත් ඇතැම් සිදුවීම් පුරාවිද්‍යාත්මක සාධක ඇසුරින් තහවුරු වෙයි. එලෙස සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන සමකාලීන හා පූර්ව කාලීන ඉතිහාසගත සිදුවීම් යම් අයුරකින් පුරාවිද්‍යාත්මකව තහවුරු කරගත හැකි බැව් පෙන්වා දීම හා සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන තොරතුරු පූර්ණ වශයෙන් බැහැර නොකළහැකි බැව් පෙන්වා දීම මෙහි අරමුණ වේ.

### උපන්‍යාසය

යාපහුව ඓතිහාසික ස්මාරක ස්ථානයෙහි සිදුකරන ලද පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ අනාවරණව වී ඇති දත්ත ඇසුරින් යාපහුව ස්මාරක ස්ථානය පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වී ඇති බොහෝමයක් තතු තහවුරුවන බැවින් මෙරට ඇති සෑම ඓතිහාසික ස්ථානයක් සම්බන්ධව ම සාහිත්‍ය මූලාශ්‍රයාගත ඉතිහාස තතු පුරාවිද්‍යාත්මක දත්ත ඇසුරින් තහවුරුකොටගත හැකිය. එසේ ම ඓතිහාසික වැදගත්කම් සහිත සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන තොරතුරු වැඩි ප්‍රමාණයක් සත්‍ය වශයෙන් අධ්‍යයන හා පර්යේෂණ කාර්යයන් සඳහා පාදක කොටගතගත හැකිය.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය ප්‍රධාන වන හෙයින් යාපහුව පරිශ්‍රයෙහි පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම් සිදුකර ඇති ස්ථාන හා ඒවා තුළින් හෙළි වී ඇති පුරාවිද්‍යාත්මක දත්ත පිළිබඳව අධ්‍යයනය කිරීම හා සාහිත්‍ය විමර්ශනය සඳහා පුස්තකාල අධ්‍යයනය සිදුකෙරේ.

මෙහි දී ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතුවල දී කැණීම්, ගවේෂණ හා සංරක්ෂණ කටයුතුවලින් හෙළි වී ඇති පුරාවිද්‍යාත්මක දත්ත වාර්තාවන් වන ශිලා මෙවලම්, මැටි බඳුන්, නාණක විද්‍යා මූලාශ්‍රය, අභිලේඛන, පබළු, පාෂාණමය නිර්මාණ, ගඩොළු නිර්මාණ, ධාන්‍ය වර්ග, රෙදි, ලෝහ නිර්මාණ, ස්වාභාවික තැන්පතු,

කාලනිර්ණය කරන ලද දෑ මෙන්ම සංචාරකයින්ගේ පැමිණීම සම්බන්ධව වන සහභාගීත්ව නිරීක්ෂණ යනාදිය භාවිත කෙරේ.

මෙහි දී පුරාවිද්‍යාත්මක දත්තයන් හා සංසන්දනය කර බැලීම සඳහා ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රයයන් වශයෙන් මහාවංසය, පූජාවලිය, දළදා සිරිත, රාජරත්නාකරය, සද්ධර්මාලංකාරය, නිකාය සංග්‍රහය, දළදා පූජාවලිය, සිංහල බෝධිවංසය, අස්ගිරිතල්පත, වන්නි උපත, වන්නි විත්තිය සහ වන්නි කඩඉම්පොත, කුරුණෑගල විස්තරය, දඹදෙණි අස්න හා කඳවුරුසිරිත යන සාහිත්‍ය මූලාශ්‍රයයන් පරිශීලනය කෙරේ.

සාකච්ඡාව

මූලාශ්‍රය යනුවෙන් සාමාන්‍ය වශයෙන් හැඳිනගනු ලබන්නේ ඉතිහාසය රචනා කිරීමේ දී පාදක කොටගන්නා වූ මූලයන් ය. මෙම මූලාශ්‍රයයන් නොපැවතියේ නම් අතීතය සම්බන්ධව වන කරුණු කාරණා වර්තමානයෙන් වියැකී ගොස් වර්තමානයට අතීතයෙන් ලද හැකි පාඩම් අහිමි වන්නේය. අප විසින් ඉතිහාසය හදාරනු ලබන්නේ මෙම මූලාශ්‍රයයන්ට අනුවය. ඉතිහාසයට අයත් විෂයය සීමාව හා ප්‍රමාණය තීරණය කරනුලබන්නේ ද මෙම මූලාශ්‍රයයන් විසිනි. එම නිසාවෙන් ම ඉතිහාසය හැදෑරීමට ඇති මූලාශ්‍රය පිළිබඳ දැනුවත්වීම අත්‍යවශ්‍ය කරුණකි (පෙරේරා, 1964: 46).

ඉතිහාසය හැදෑරීමේ දී උපයෝගී කරගන්නා වූ මූලාශ්‍රයයන් ප්‍රධාන වශයෙන් වර්ග දෙකක් යටතට පත්කෙරේ. ඒ සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යා මූලාශ්‍රය වශයෙනි. ඇතැම් ඓතිහාසික අවධීන් පිළිබඳ හැදෑරීමට මින් ඉවහල් වන්නේ සාහිත්‍ය මූලාශ්‍රයයන් පමණි. එසේ වුව ද වැඩිමනක් ඓතිහාසික අවධීන් පිළිබඳ හැදෑරීමට මෙම මූලාශ්‍රයයන් දෙකොටස ම භාවිතයට ගනුලබයි. එසේ වුව ද සාහිත්‍ය මූලාශ්‍රයයන් ඉතිහාස කරුණු හැදෑරීට භාවිත කිරීමේ දී වඩාත් පරෙස්සම් සහගතව සිදුකළ යුතුව තිබේ. ඒ ඇතැම් ඓතිහාසික සිදුවීම් සිදු වූ සමයත් එම සිදුවීම් විස්තර කෙරෙන සාහිත්‍ය කෘති රචනාවූ සමයත් අතර වර්ෂ ගණනාවක පරතරයක් පවත්නා බැවිනි. එසේ වුව ද පුරාවිද්‍යා මූලාශ්‍රය අදාළ ඓතිහාසික සිදුවීම් හා සමකාලීන වන නිසාවෙන් එම මූලාශ්‍රයයන් වඩාත් විශ්වාසනීය සේ සැලකිය හැකිය. එසේ ම සාහිත්‍ය මූලාශ්‍රයයන්ට වඩා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් වඩාත් විශ්වාසනීය සේ සැලකෙන තවත් කාරණයක් වන්නේ සාහිත්‍ය මූලාශ්‍රයයන් නිරන්තරව සුළු සිදුවීම් වටා ගොතන ලද දෑ වීමත් පුරාවිද්‍යා මූලාශ්‍රය සිදු වූ දේ නිසි ආකාරයෙන්ම ඉදිරිපත් කර පැවතීමත් යන කරුණයි (හෙට්ටිආරච්චි, 1994:1).

සාහිත්‍ය මූලාශ්‍රයයන් රචනා කිරීමේ දී ඒවා රචනාකරන ලද තැනැත්තන්ගේ පුද්ගලික රුචිකත්වයන් හා අරුචිකම් මෙන්ම ඔවුන් ජීවත් වූ පරිසරයෙහි බලපෑම් ද එවාට එක් වී තිබිය හැකිය. එම නිසාම ඒවායෙහි පවත්නා

ඓතිහාසික සිදුවීම් තුළට ප්‍රබන්ධ එක්වී අතිශයෝක්ති බවට ඇතැම්විට පත්වී තිබේ. පුරාවිද්‍යා මූලාශ්‍රයයන්හි මෙම ප්‍රබන්ධ ස්වරූපය දැකිය නොහැකි වන්නේ සීමිත පරාසයක විශාල ආයාසයක් ගෙන ඒවා නිමවිය යුතු වීම නිසාවෙනි. එබැවින් පුරාවිද්‍යා මූලාශ්‍රයයන් වෙත ප්‍රබන්ධයන්හි ආභාසය ලැබී නොමැත (එම, 1).

මෙහි දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙන් සලකනු ලබන්නේ අතීතයේ විසූවන් විසින් නිර්මාණය කරන ලද, එම අවධීන්හි සිටි ජනතාවගේ ජීවන තත්ත්වයන් පිළිබඳ තතු කියාපාන මූලාශ්‍රය සමුදායකි. එම නිර්මාණ අතර ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් රළු උපකරණ මෙන් ම ඓතිහාසික අවධියේ දී නිපදවන ලද මනහර සිතුවම්, ප්‍රතිමා, ගොඩනැගිලි ආදී දෑ මෙන්ම පුරාවිද්‍යාත්මක ක්‍රමවේදඅනුසාරයෙන් මතුකරගනු ලබන දේවල් අන්තර්ගතය. පුරාවිද්‍යාත්මක වශයෙන් වටිනාකම් සහිත බොහෝ දෑ විනාශ වී ඇත්තේ වුව ද ඉක්මනින් විනාශ නොවන කල් පවත්නා ද්‍රව්‍යයන්ගෙන් සාදන ලද දෑ වත්මනට ද ශේෂ වී තිබේ. පුරාවිද්‍යාත්මක සාධකයන් ඇසුරින් හෙළිවන පැතිකඩ සීමා සහිත වුව ද ලිඛිත මූලාශ්‍රයඇසුරින් කියැවෙන කරුණු තහවුරු කිරීමට ඒවා තුළින් හැකියාවක් ලැබේ (පෙරේරා, 1964ඃ 72).

පොදුවේ ගත් කල මෙරට ඉතිහාසය අඛණ්ඩව රචනා කිරීම සඳහා උපයෝගී කොටගත හැකිවන්නේ සාහිත්‍ය මූලාශ්‍රයයන් ය. එසේ වුව ද මෙම අඛණ්ඩ ඉතිහාසය රචනා කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් වෙතින් පැතිකඩ රැසක් නියෝජනය වන පරිදි සහයෝගයක් ලැබේ. ඉන් පළමුවැන්න වන්නේ සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන තොරතුරු තහවුරු කරගැනීමට උපකාරි වීමයි. දෙවැන්න වන්නේ සාහිත්‍ය මූලාශ්‍රයයන්හි සඳහන් සදොස් සහිත ස්ථානයන් නිවැරදි කරගැනීමට උපකාරී වීමය. තෙවැන්න වන්නේ කිසිදු සාහිත්‍ය මූලාශ්‍රයක සඳහන් නොවන ඉතිහාසයට අදාළ තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන් මතින් ලබා ගැනීමට හැකි වීමයි. එම නිසා ඒවා සාහිත්‍ය මූලාශ්‍රයයන්ට ඌන පූරක වශයෙන් යෙදිය හැකි වෙයි (හෙට්ටිආරච්චි, 1994ඃ 1).

සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන ඓතිහාසික කරුණු තහවුරු කිරීමේ දී පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයයන්හි උපයෝගිතාව පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා යාපහුව උරුම ස්ථානයෙහි සිදුකර ඇති පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ හෙළි වී ඇති තොරතුරු පාදක කොටගත හැකිව තිබේ. යාපහුව පුරාවිද්‍යා ස්මාරක ස්ථානය සම්බන්ධව අධ්‍යයනය කිරීමේ දී එම ස්ථානය පිළිබඳව පෞරාණික සාහිත්‍ය මූලාශ්‍රය රැසකම කරුණු සඳහන්ව ඇති බැව් පෙනී යයි. මහාවංසය, පූජාවලිය,දළදාසිරිත, රාජරත්නාකරය, සද්ධර්මාලංකාරය, නිකායසංග්‍රහය, දළදා පූජාවලිය, සිංහල බෝධිවංශය, අස්ගිරි තල්පත, වන්නි උපත, වන්නි විත්තිය සහ වන්නි කඩඉම්පොත, කුරුණෑගල විස්තරය, දඹදෙණි අස්න යන විවිධ යුගයන්හි රචනාවී ඇති මූලාශ්‍රයයන් තුළ මෙම ස්ථානය හැඳින්වීම සඳහා විවිධ නම් යොදා තිබීමෙන් ම ඒ බැව් පැහැදිලි වෙයි. ඒ නම් අතර ''යහපව්''''යාපව්ව'' ''සුන්දරගිරි

**නම් යාපවු නුවර'' ''සුභැරගිරිපුර'' ''යාපවු පුර'' ''අයෝ පර්වත'' ''යාපවු සුන්දරගිරි පවුව'' ''යාපහු නුවර'' ''යාපහුව'' ''යාපා නුවර, සුන්දරගිරි පර්වතය'' ''යාපවුගල''** (මහාවංසය, පරි-81, ගාථා-2) (පූජාවලිය, පරි-34ඃ 800) (දළදා සිරිත, පරි-6ඃ 70) (රාජරත්නාකරය ඃ 65) (සද්ධර්මාලංකාරය, තිස්සනාග වර්ගය, ගාථා-4) (නිකායසංග්‍රහය ඃ 25) (දළදා පූජාවලිය : 61) (සිංහල බෝධිවංශය : 199) (අස්ගිරි තල්පත :6) (වන්නි උපත, වන්නි විත්තිය සහ වන්නි කඩඉම්පොත :93) (කුරුණෑගල විස්තරය, ජේද-24,25)(දඹදෙණි අස්න හා කඳවුරු සිරිත :18).

මෙම ස්ථානයෙහි සිදුකරඇති කැණීම්, ගවේෂණ හා සංරක්ෂණ ක්‍රියාමාර්ගයන්ගෙන් හෙළිවී ඇති පුරාවිද්‍යාත්මක දත්ත මගින් පැරණි වංසකතා, කඩයිම්පොත්, බණකතා ආදී වන සාහිත්‍ය මූලාශ්‍රයයන්හි යාපහුව සම්බන්ධව දක්වෙන ඇතැම් තොරතුරු රැසක් තහවුරු වී තිබේ (පුරාවිද්‍යා පාලන වාර්තා,2011 වර්ෂය සඳහා වන ගවේෂණ වාර්තාව, බංගලාපිටිය ස්තූප කැණීම් වාර්තාව, ඉර හඳ නොපෙනෙන ගුහාව කැණීම් වාර්තාව, යාපහුව පිටදිය අගල කැණීම් වාර්තාව 2015, YP/OC/15 - 1 ගොඩනැගිලි කැණීම් වාර්තාව, පිටත නගර ස්තූප කැණීම් වාර්තාව).

මෙම සියලු ම දත්ත විශ්ලේෂණය කර බැලීමේ දී පෙනීයන්නේ සාහිත්‍ය මූලාශ්‍රයයන්හි දැක්වෙන ඓතිහාසික ස්ථානයන් සම්බන්ධව වන කරුණු පුරාවිද්‍යාත්මක දත්ත ඇසුරින් තහවුරු කරගත හැකි බවත් යාපහුව ස්මාරක ස්ථානය ඒ සඳහා නිදර්ශනයක් වශයෙන් ගතහැකි වන බවත්ය.

ප්‍රමුඛ පද : මූලාශ්‍රය, සාහිත්‍ය, පුරාවිද්‍යාව, ඉතිහාසය, යාපහුව

## ආශ්‍රිත ග්‍රන්ථ

*අස්ගිරි තල්පත*.(1997). (දෙවන සංස්කරණය).(සංස්.) රෝහණධීර,මැන්දිස්.මහරගම: තරංජී ප්‍රින්ටර්ස්.

*මහාවංසය*.(2003).(සංස්.) ශ්‍රී සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ පණ්ඩිතුමා, දෙහිවල: බෞද්ධසංස්කෘතික මධ්‍යස්ථානය.

පෙරේරා, ලක්ෂ්මන්.(1964).*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

හෙට්ටිආරච්චි, එස්.බී.(1994).*ශ්‍රී ලංකාවේ ඉතිහාසය - අනුරාධපුර යුගය*. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

*ඉර හඳනොපෙනෙන ගුහා කැණීම් වාර්තාව*.(2014). මධ්‍යම සංස්කෘතික අරමුදල, යාපහුව ව්‍යාපෘතිය.

*පිටත නගර ස්තූප කැණීම් වාර්තාව*.(2016). මධ්‍යම සංස්කෘතික අරමුදල, යාපහුව ව්‍යාපෘතිය.

*පිටදිය අගල කැණීම් වාර්තාව*,(2015), මධ්‍යම සංස්කෘතික අරමුදල, යාපහුව ව්‍යාපෘතිය.